පේරාදෙණිය සරසවියේ ඉංජිනේරු පීඨයේ සිසුවියක් මිය ගිය පුවත, මාධ්‍ය තුළ අවධානයට ලක්ව තිබිණි. බොහෝ මාධ්‍ය තුළ මෙම මරණය, දිවි තොර කර ගැනීමක්ද නැති ද යන්න ස්ථිරව නොදක්වමින් වාර්තා කර තිබිණි. මෙම සිදුවීම සම්බන්ධයෙන් ඉදිරිපත් වූ ඇතැම් පුවත් වාර්තාවන් තුළ , මීන් පෙර සිදු වූ දිවි තොර කර ගැනීමේ සිදුවීම් පිළිබඳව ද සඳහන් වී තිබිණි.
යම්කිසි මරණයක් දිවි තොර කර ගැනීමක් විය හැකි බවට සැකයක් හෝ තිබේ නම්, හදිසි උපකාරක අංක සඳහන් කිරීම ඇතුළු, අදාල විය හැකි දිවි තොර කර ගැනීම් වාර්තාකරණය පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශයන්ට හැකිතාක් අනුකූල වීම යෝග්‍ය වේ.
මෙම එක් පුවත් වාර්තාවක් සමගින් හෝ හදිසි උපකාරක අංක සඳහන්ව නොතිබුණු බවද සඳහන් කළ යුතු වේ.
ඒ අනුව, මෙම සරසවි සිසුවියගේ මරණය වාර්තා කිරීමේදී වඩාත් වගකීම් සහගත ලෙසින් වාර්තා කර ඇත්තේ කවුරුන්ද?
උපකාරක අංකයක් පළ කරමු, ජීවිතයක් රැකගනිමු!
හදිසි උපකාරක අංක:
* CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308
* ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු

# පේරාදෙණිය ඉංජිනේරු සිසුවියගේ මරණය

## දිවි තොර කර ගැනීම් වාර්තාකරණයන් සහ ආචාර ධර්ම උල්ලංඝනයන්

| |
|---|
| දිවි තොර කරගත් අයගේ ඡායාරූප පළ කර ඇත |
| අද, ලංකාදීප, දිනමිණ |
| දිවි තොර කරගත් ආකාරය සඳහන් කර ඇත |
| අද |
| විශ්වවිද්‍යාලය තුළ මින් පෙර සිදුවූ දිවි තොර කර ගැනීම් පිළිබඳ සඳහන් කර ඇත |
| අරුණ, දිනමිණ, මව්බිම |
| උපකාරක අංක පළකර නොමැත! |
| අද, අරුණ, දිනමිණ, ලංකාදීප, මව්බිම, දිවයින |

2023 මාර්තු 02, 03 දෙදින තුළ තෝරාගත් සිංහල පුවත් දත්ත ඇසුරිනි.

ETHICS EYE

වන්න!